# අරමුදල් කළමනාකරුගේ වාර්තාව

හිතවත් ආයෝජකතුමනි,

2024 සැප්තැම්බර් 30 වැනි දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා CT CLSA Gilt Edged අරමුදලේ අර්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අපි සතුටු වෙමු.

ආර්ථික සමාලෝචනය සහ ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා ආර්ථිකය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී -3.0%[1] වාර්ෂික හැකිලීමකට සාපේක්ෂව 2024 වර්ෂයේ දී +4.7%[1] වසරකින් ප්‍රසාරණය වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2024 පළමු කාර්තුවේදී ආර්ථිකය +5.0% ප්‍රසාරණය විය. 2024 දෙවන කාර්තුව තුළදී, ආර්ථිකයේ අංශ තුනම ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇති අතර, කෘෂිකාර්මික, කර්මික සහ සේවා අංශ පිළිවෙලින් +1.7%[1], +10.9%[1] සහ +2.5%[1] ලෙස වර්ධනය විය. 2024 ජූනි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (IMF) කාර්ය මණ්ඩල වාර්තාවට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2025 වර්ෂයේදී +2.7%[2] වේගයකින් වර්ධනය වීමට පෙර 2024 වර්ෂයේදී +2.0%[2] ප්‍රසාරණයක් අත්විඳිනු ඇතැයි පුරෝකථනය කර ඇත. ආර්ථික අර්බුදයෙන් පසුව රජය විසින් සිදු කරන ලද ආර්ථික හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට (CBSL) සිය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ස්ථාවරය පවත්වා ගැනීමට ඉඩ සලසමින් එහි මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට සහ මිල මට්ටම් ස්ථාවර කිරීමට ඉවහල් වී ඇති බැවින්, ශ්‍රී ලංකා ආර්ථිකය 2024 දෙවන කාර්තුවේදී ප්‍රකෘතිමත් වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. බාහිර වශයෙන් ගත් කල, සංචාරක ඉපැයීම්වල සහ සේවක ප්‍රේෂණවල කැපී පෙනෙන වර්ධනය 2024 පළමු මාස නවය සඳහා බාහිර ජංගම ගිණුමේ ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කිරීමට හේතු වූ අතර වෙළෙඳ වාර්ෂික වෙළෙඳ හිඟය පුළුල් වීමේ බලපෑම අවම කිරීමට එය ඉලපා ඇත. විදේශ ණය ආපසු ගෙවීම අත්හිටුවීමත් සමඟ රට වෙත ඩොලර් ගලා ඒමේ පෙර කී දියුණුව හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට (CBSL) වෙළෙඳපොළ මැදිහත්වීම් හරහා සිය විදේශ විනිමය සංචිත ශක්තිමත් කර ගැනීමට හැකි වී තිබේ. ස්ථාවර සහ වැඩිදියුණු වන සාර්ව ආර්ථික දර්ශක, මෑතකදී අවසන් වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී තේරී පත් වූ ජනාධිපතිවරයාගේ දේශපාලන පක්ෂය බහුතර බලයක් ලබා ගැනීම සහ පවතින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් (IMF EFF) වැඩසටහනේ රැඳී සිටීමට රජය දක්වන කැමැත්ත ධනාත්මක ලෙස අපි දකිමු.

රුපියල ශක්තිමත්වීම, හිතකර ගෝලීය භාණ්ඩ මිල ගණන් සහ ආර්ථික ක්‍රියාකාරකම්වල ක්‍රමානුකූල ප්‍රකෘතිය මධ්‍යයේ උද්ධමන පීඩනය අඛණ්ඩව පහත වැටීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 2024 දී සිය මුදල් ලිහිල් කිරීමේ ස්ථාවරය දිගටම කරගෙන ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 පළමු මාස නවය තුළ සිය ප්‍රතිපත්ති අනුපාත පදනම් ඒකක 75 කින් ලිහිල් කරන ලද අතර, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙලින් 8.25% සහ 9.25% ලෙස පැවතිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස වූයේ කාලීන අවධමනය, බාහිර අංශයේ දියුණුව, අනාගත උද්ධමන අපේක්ෂාවන් මධ්‍යස්ථ මට්ටමින් පවත්වා ගැනීම සහ වෙළෙඳපොළ ණය අනුපාතික පහළට ගැලපීමට ඉඩ ප්‍රමාණවත් නොවීම මධ්‍යයේ බලාපොරොත්තු වූවාට වඩා ගැඹුරින් ප්‍රතිපත්ති අනුපාත ලිහිල් කිරීමක් අවශ්‍ය බවයි.

මාස 3, මාස 6 සහ මාස 12 සඳහා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභය 2024 සැප්තැම්බර් මස අවසන් වන විට පිළිවෙලින් 10.49%[3], 10.72%[3] සහ 10.05%[3] ලෙස පැවතිණි. රාජ්‍ය සුරැකුම්පත් එළදාව පහත වැටීමට සමගාමීව, මූල්‍ය තත්ත්වයේ සහ වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ දියුණුවීම මධ්‍යයේ සැප්තැම්බර් අග වන විට බරතබන ලද සාමාන්‍ය ණය දීමේ අනුපාතය (AWPLR) සමඟ 9.32%[4] ට වෙළඳපොල පොලී අනුපාත පහතට සකස් විය.

---

[1] Department of Census and Statistics, National Accounts 2024Q2

[2] https://www.imf.org/en/Publications/CR/Issues/2024/06/13/Sri-Lanka-2024-Article-IV-Consultation-and-Second-Review-Under-the-Extended-Fund-Facility-550261

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) මගින් මනිනු ලබන ලක්ෂ්‍ය උද්ධමනය අවධමනකාරී තත්ත්වයක් පෙන්නුම් කරමින් 2024 සැප්තැම්බර් වන විට 0.5%[5] ක මට්ටමේ පසුවිය. ආහාර (-0.3% YoY) සහ ආහාර නොවන (-0.5% YoY) යන කාණ්ඩ දෙකම පරිපාලනමය වශයෙන් තීරණය කරන ලද මිල ගණන්වලට පහළට ගැලපීම් සහ සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු කිරීම මධ්‍යයේ සැප්තැම්බර් මාසයේදී අවධමනයක් වාර්තා කළේය. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) මගින් මනිනු ලබන උද්ධමනය 2024 සැප්තැම්බර් වන විට ලක්ෂ්‍යයට ලක්ෂ්‍ය පදනම මත -0.2% [7] ක් ලෙස සටහන් විය. පවතින අවධමනකාරී තත්ත්වයන් ඉදිරි මාස කිහිපය සඳහා පවත්වා ගෙන යාමට සහ ඉන් පසුව ක්‍රමයෙන් එහි ඉලක්කගත මට්ටම වන 5% සමඟ සමපාත වනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

මේ අතර, 2024 සැප්තැම්බර් අවසානය වන විට දළ නිල සංචිතය ඇ. ඩොලර් බිලියන 6[8] ක්ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය චීන මහජන බැංකුවේ ණය හුවමාරු පහසුකම වන ඇ. ඩො. බිලියන 1.4 ට සමාන වේ. එමෙන්ම , එය භාවිතයේ කොන්දේසි වලට ද යටත් වේ. සංචාරක ව්‍යාපාරයේ සහ සේවක ප්‍රේෂණවල ශක්තිමත් ඩොලර ප්‍රවාහයේ බලපෑම නිසා ආසන්න කාලීනව ශ්‍රී ලංකා රුපියල ස්ථාවරව පවතිනු ඇතැයි අපි අපේක්ෂා කරමු, කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම, ආනයන පාලනයන් ලිහිල් කිරීම (විශේෂයෙන් වාහන ආනයන ලිහිල් කිරීම) සහ විදේශ ණය සේවා නැවත ආරම්භ කිරීම 2025 වර්ෂයේදී පීඩනයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා රුපියල වාර්ෂික  පදනම මත +8.2% කින් ඉහළ ගොස් 2024 සැප්තැම්බර් අවසානය වන විට ඇ. ඩොලරයට රු. 229.4 (රු.299.4/US$) ලෙස පැවතුනි.

---

[3] https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/press/pr/press_20240927_treasury_bill_issuance_held_on_25_september_2024_e.pdf

[4] https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/statistics/wei/WEI_20240927_e.pdf

[5] Department of Census and Statistics, Movements of CCPI, Pg. 01

[6] Department of Census and Statistics, Food and Non-Food inflation, Pg. 01

[7] Department of Census and Statistics, Movements of NCPI, Pg. 01

[8] Central Bank of Sri Lanka, Weekly Economic Indicators – 18 Oct, Pg. 15

අරමුදල් කාර්ය සාධනය

2024 සැප්තැම්බර් 30 වන දිනට, අරමුදලේ ඒකකයකට ශුද්ධ වත්කම් අගය රු.16.5873ක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 සැප්තැම්බර් මස අවසන් වන විට වර්ෂය තුළ මේ දක්වා 7.9% (වාර්ෂික නොවන)  ප්‍රතිලාභයක් ලබා දී ඇත. 2024 සැප්තැම්බර් 30 වන විට, ඔබේ අරමුදලේ ආයෝජනයන් දෛනික උච්චාවචනයන්ගෙන් ආරක්ෂා කෙරෙන ප්‍රතිමිලදී ගැනීම් වලින් සමන්විත වේ.